# දරුවන් උදෙසා බයිබලයක්



# ගිඩියොන්ගේ කුඩා හමුදාව

**ඉදිරිපත් කරන්නා:** Edward Hughes

**නිදර්ශනය කරන්නා:** Janie Forest
Alastair Paterson

**සකස්කරන්නා:** Ruth Klassen

**පරිවර්ථනය කරන්නා**

**නිෂ්පාදනය කරන්නා:** Bible for Children
www.M1914.org

©2025 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.





ජෝෂුවාගේ මරණයෙන් පසු, සියලු ඉශ්‍රායෙල් ජනයා දෙවියන් වහන්සේට අකීකරු වී උන්වහන්සේව තම ජීවිතයෙන් ඉවත් කළෝය. අසල්වැසි මිදියන්වරුන්ට ඊශ්‍රායෙල්හි භෝග සහ ගෙවල් ගිනි තැබීමට දෙවියන් වහන්සේ ඉඩ හැරිය සේක. ඊශ්‍රායෙල්වරුන්ට ජීවත් වීමට සිදු වූයේ ගුහාවලය.


එක් ඊශ්‍රායෙල් ජාතිකයෙකු
වූ ගිඩියොන්ට තිරිඟු වගා කිරීමට
රහසිගත ස්ථානයක් තිබෙන්නට ඇත.
ඔහු විශාල ගසක් යට සැඟවූ
මුද්‍රික යන්ත්‍රයකින් ධාන්‍ය
අඹරමින් සිටියේය.
මිදියන්වරු එම
ස්ථානය දැන
සිටියේ නැත.
නමුත් දෙවියන් වහන්සේ
දැනසිටිය සේක! දෙවියන්
වහන්සේ
ගිඩියොන්ට
පණිවිඩයක්
දේවදූතයෙකු
අත එවූ සේක.
3


දෙවියන් වහන්සේට අවශ්‍ය වූයේ ගිඩියොන් ලවා ඔහුගේම
පියා සෑදූ බොරු දෙවියෙකුගේ රූපය විනාශ කර සැබෑ
දෙවියන් වහන්සේට  පූජාසනයක් ගොඩනගා ගැනීමටය.
ගිඩියොන් තම රටවැසියන් තමාව මරා දමනු ඇතැයි බියෙන්
සිටියද, ඔහු දෙවියන් වහන්සේගේ අණ ඉටු කළේය.
4


දුෂ්ට මිදියන්වරුන්ට එරෙහිව ඊශ්‍රායෙල් හමුදාවේ
නායකත්වය ගිඩියොන්ට දීමට දෙවියන් වහන්සේට වුවමනා
විය. ඒත් ගිඩියොන් බිය වූයේය. දෙවියන් වහන්සේ තමා
සමඟ සිටින බවට විශේෂ ලකුණක් ඔහු ඉල්ලා සිටියේය.
ඉන්පසු ඔහු ලොම් සහිත බැටළු හමක් බිම එලුවේය.
5


“ලොම් මත පමණක් පිනි තිබී
මුළු පොළොවම වියළී තිබේනම්,
ඔබවහන්සේ පැවසූ පරිදි මාගේ අතින් ඊශ්‍රායලය
බේරා ගන්නා බව මම දැන ගනිමි” යි ගිඩියොන්
යාච්ඤා කළේය. උදයේ මුළු පොළවම වියළිව
තිබියදී ලොම් තෙත් වී තිබුණි.
6


ගිඩියොන් තව දුරටත් සැක කළේය.
දැන් ඔහුට දෙවියන් වහන්සේ විසින්
ලොම් මතට නොවැටී පොළොව
මතට පමණක්  පිනි එවා තබනු
දකින්නට අවශ්‍ය විය. ඊළඟ උදෑසන
බිම තෙත් වී තිබුණි, නමුත් ලොම්
වියළිව තිබුනේය!
7


ගිඩියොන් 32000 ක හමුදාවක් රැස් කළේය. දෙවියන්
වහන්සේ එය මිනිසුන් 300ක් දක්වා අඩුකළ සේක. “මාගේ
අතින්ම මා ගැළවුනා” යනුවෙන් ඊශ්‍රායෙල් ජනතාව
කියනවාට දෙවියන් වහන්සේ කැමති නොවූ සේක. දෙවියන්
වහන්සේ පමණක් ඉශ්‍රායෙල්ගේ ගැළවුම්කාරයා වූ සේක.
32000
10000
300
8

ගිඩියොන් තවමත් බියෙන් සිටින බව දැනගත් දෙවියන් වහන්සේ, ඔහුට එක් මිදියන් සොල්දාදුවෙකු තවත් කෙනෙකුට කියන අමුතු සිහිනයක් ගැන රහසින් ඇසෙන්නට ඉඩ හැරිය සේක. ඒ සිහිනයට අනුව රොටියක් මිදියන්වරුන්ගේ කූඩාරමකට පෙරළී ඇවිත් එය විනාශ කර දැමීය.



9

අනෙක් ආරක්ෂක භටයා බියට පත් වූයේය. "ඒ ... ගිඩියොන්ගේ කඩුව." ඔහු කෑගැසුවේය. ගිඩියොන් සිහිනය සහ එහි තේරුම අසා දැනගත් විට, දෙවියන් වහන්සේ තමාට ජයග්‍රහණය ලබා දෙන බව ඔහුට දැනුණි.



10

ගිඩියොන් රාත්‍රී ප්‍රහාරයක් සැලසුම් කළේය. ඔහු සෑම සොල්දාදුවෙකුටම හොරණෑවක්ද ඇතුළත පන්දම් සහිත හිස් භාජනද දුන්නේය. ඔවුහු මිදියන්වරුන්ගේ හමුදාව වට කළෝය.



11

ගිඩියොන්ගේ සංඥාවෙන් සොල්දාදුවෝ හොරණෑ පිඹිමින්, කළ බිඳදමා පන්දම් දල්වා ගත්හ. මොනතරම් නම් ඝෝෂාවක්ද? මොනතරම් නම් කලබැගෑනියක්ද? බියට පත් මිදියන්වරු නැඟිට පලා ගියෝය.



12

මේ මහා ජයග්‍රහණයෙන් පසු ඊශ්‍රායෙල් සෙනඟ තමන්ව පාලනය කරන ලෙස ගිඩියොන්ගෙන් ඉල්ලා සිටියෝය. "මම ඔබව පාලනය කරන්නේ නැත. සමිඳාණන් වහන්සේ ඔබව පාලනය කරන සේක" යි ගිඩියොන් පිළිතුරු දුන්නේය. මිනිසුන්ගේ ජීවිත පාලනය කිරීමට අයිතිය ඇත්තේ දෙවියන් වහන්සේට පමණක් බව ඔහු දැන සිටියේය.



13

ගිඩියොන්ගේ කුඩා හමුදාව

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

විනිශ්චයකාරයන්ගේ පොත 6-8

**"ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ"**
**ගීතාවලිය** 119:130

14

# අවසානය

15

60



මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)